NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA COLOMBO 10

## ඒකක පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය 12: ජෛව විවිධත්වය |
|---|---|---|

## I කොටස

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. පහත සඳහන් සතුන්ගෙන් ශ්‍රී ලංකාවට ආවේනික සතුන් වන්නේ,

(1). වඳුරා (2). මොනරා (3). පොළඟා (4). වලිකුකුළා

02. ජෛව විවිධත්වය හායනය සඳහා හේතුවන ස්වභාවික ක්‍රියාවලියක් ලෙස සැලකිය නොහැක්කේ,

(1). උල්කාපාත පතිතවීම
(2). ගිනිකඳු පිපිරීම
(3). සුනාමි
(4). වනාන්තර හායනය

03. ජෛව විවිධත්ව උණුසුම් කලාපයක් ලෙස හැඳින්වෙන ප්‍රදේශයක ලක්ෂණයක් නොවන්නේ,

(1). අධික උණුසුම් ප්‍රදේශයක් වීම
(2). ජීවී ඝනත්වය අධික ප්‍රදේශයක් වීම
(3). ආවේනික ජීවී විශේෂ වැඩි සංඛ්‍යාවක් සහිත වීම
(4). එම ජීවීන් සඳහා පවතින තර්ජන වැඩිවීම

04. පරිසර පද්ධතියක දැකිය හැකි ජීවී-අජීවී සම්බන්ධතාවයක් ලෙස සැලකිය හැක්කේ,

(1). සතුන් විසින් ශාක ආහාරයට ගැනීම
(2). ඇතැම් ක්ෂුද්‍රජීවීන් ජීවී දේහ මත යැපීම
(3). ශාක ප්‍රභාසංශ්ලේෂණය සඳහා වායුගෝලයෙන් $CO_2$ උරා ගැනීම
(4). වර්ෂා ජලයෙන් පාංශු ඛාදණය වීම

05. • කරදිය හා මිරිදිය මිශ්‍ර වීම
• ආර්ථික වටිනාකමකින් යුත් මත්ස්‍ය විශේෂ බහුල වීම
• ජෛව විවිධත්වය

ඉහත ලක්ෂණ සහිත ජලජ පරිසරයක් වන්නේ,

(1). ගංගා (2). ගංමෝය (3). අභ්‍යන්තර ජලාශ (4). සාගර

06. පහත සඳහන් ඒවායින් නිවර්තන වැසි වනාන්තරයක් නොවන්නේ,

(1). සිංහරාජ වනාන්තර
(2). කන්නෙළිය
(3). හග්ගල
(4). දෙදියගල

07. ජෛව විවිධත්වය පිළිබඳ අසත්‍ය ප්‍රකාශය වන්නේ කුමක්ද?

(1). ඉහළ ජෛව විවිධත්වය මගින් පරිසර පද්ධතියේ ස්ථායිතාව ඉහළ යයි
(2). ආසියාතු කලාපයේ වැඩිම සපුෂ්ප ශාක විශේෂ සංඛ්‍යාවක් ලංකාවේ ඇත
(3). මේ නිසා ජීවී විශේෂ අතර තරගය වැඩිවේ
(4). මේ නිසා ආහාර සඳහා ඇති තරගය අවම කර ගත හැක



EXAMRESULTS.LK

08. ජෛව විවිධත්ව හායනයට හේතුවන මානව ක්‍රියාකරකමකි,

(1). ගිනිකඳු පිපිරීම (3). සුනාමි

(2). ලැව්ගිනි (4). මංමාවත් ඉදිකිරීම

09. පරිසරය පිළිබඳ ඔබ තුළ වර්ධනය විය යුතු යහපත් ආකල්පයකි,

(1). හැකි සෑම විටම ශාක සිටුවීම (3). අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කිරීම

(2). පරිසර සංරක්ෂණය ගැන දැනුවත් කිරීම (4). ඉහත සියල්ලම

10. නොහික්ත දර්ශනවල ඇති හිතකර ලක්ෂණයක් නොවන්නේ,

(1). අස්වැන්න අඩුවීම (3). අහිතකර පරිසර තත්ත්වය දරා සිටීම

(2). පළිබෝධයින්ට ඔරොත්තු දීම (4). ලෙඩ රෝගවලට ඔරොත්තු දීම

11. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තරවල දැකිය නොහැකි ශාකයකි,

(1). පළු (2). හොර (3). බුරුත (4). වීර

12. නිර්මිත පරිසර පද්ධතියට අයත් නොවන්නේ,

(1). කෘෂිකාර්මික පරිසර පද්ධති (3). ජනාවාස පරිසර පද්ධති

(2). කාර්මික පරිසර පද්ධති (4). වනාන්තර

13. පහත ලක්ෂණ සහිත ශාක අයත් වනාන්තර වන්නේ,

- කුරු ශාක
- ඇඹරුණු කඳන්
- කුඩා පත්‍ර

(1). කඳුකර වනාන්තර (3). නිවර්තන වනාන්තර

(2). වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර (4). වියළි තණ බිම්

14. ශ්‍රී ලංකාවට ආවේනික මත්ස්‍ය විශේෂයක් නොවන්නේ,

(1). බන්දුල පෙතියා (3). අශෝක පෙතියා

(2). තොල් රතු වැලිගොව්වා (4). තිලාපියා

15. බිංදු ජල සම්පාදනයේ වාසියක් නොවන්නේ,

(1). කාර්යක්ෂමතාවය අඩුවීම (3). වල් පැළෑටි වර්ධනය පාලනය වීම

(2). ජලය අපතේ නොයාම (4). මිනිස් ශ්‍රමය අඩුවෙන් වැයවීම

## <u>II කොටස</u>

01. පහත සඳහන් පද හිස්තැනට සුදුසු ලෙස යොදන්න.

(කඳුකර වනාන්තර/ඕසෝන් වියන හායනය/චක්‍රීකරණය/ගඳපාන/ජනාවාස පරිසර/
ලෝම මැමත්/විශේෂ විවිධත්වය/ඒක දිශානතිකව/ජාන විවිධත්වය/මන්නාවා/තරගය)

ජෛව විවිධත්වයේ ප්‍රධාන සංරචක තුනකි. ජීවී විශේෂ අතර පවතින විවිධත්වය ............................ වේ. එකම විශේෂයේ ජීවීන් අතර පවතින විවිධත්වය ......................... වේ. ජෛව විවිධත්වය නිසා ජීවීන් අතර පවතින ......................... අවම වේ.

ගෝලීය උණුසුම ඉහළ යාම ............................ වඳ වී යෑමට බලපා ඇත. ආක්‍රමණකාරී සත්ත්වයකු වන .......................... හා ආක්‍රමණික ශාකයක් වන .............................. ජෛව විවිධත්වයට දැඩි බලපෑමක් ඇති කරයි. ජෛව විවිධත්වය හායනයට බලපාන පාරිසරික ප්‍රශ්න ලෙස ගෝලීය උණුසුම ඉහළ යාම හා ............................ සැලකිය හැක.

පරිසර පද්ධතියක ශක්තිය ...................... ගලායන අතර ද්‍රව්‍ය .......................... වේ. කුරු ශාක මෙන්ම ඇඹරුණු කඳන් සහිත ශාක ....................... වල දක්නට ලැබේ. මිනිසා තම වාසස්ථාන පිහිටුවාගත් ග්‍රාමීය හෝ නාගරික පරිසර .......................... ලෙස හැඳින්වේ.


02. පහත ඡේදයේ හිස්තැන්වලට සුදුසු වචනය ලියන්න.

(මිරිදිය, කාර්මික, ස්වාභාවික, පරිසර පද්ධති, තෘණ භූමි, කෘෂිකාර්මික, කරදිය, ස්වභාවික ජලජ පරිසර, වනාන්තර, කෘෂිකාර්මි, ස්වභාවික භෞමික පරිසර, භෞමික)

ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති i. ............................. හා නිර්මිත පරිසර පද්ධති ලෙස ආකාර දෙකකි. ස්වාභාවික පරිසර පද්ධති ii. ....................... හා iii. ......................... ලෙස ආකාර දෙකකි. ස්වාභාවික ජලජ පරිසර iv. ......................., v. ........................ හා හා කිවුල් දිය ලෙස ආකාර තුනකි. ස්වාභාවික vi. ............................. පරිසර vii. ............................ හා viii. ............................. ලෙස ආකාර දෙකකි. නිර්මිත පරිසර ix. ............................ පරිසර, x. ............................. පරිසර හා ජනාවාස පරිසර ලෙස ආකාර තුනකි. ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා බෝග වගාව හා සත්ත්ව පාලනය සිදුකිරීමට සකස් කළ පරිසර පද්ධතියක් xi. ............................. පරිසර පද්ධතියක් ලෙස හඳුන්වයි.

03. ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති පහත පහත පරිදි වර්ගීකරණ සිදු කරනු ලබයි. හිස්තැන් පුරවන්න.

A.



B. i. ජෛව විවිධත්වය ලෙස හඳුන්වන්නේ කුමක්ද?

ii. ජෛව විවිධත්වය හායනය සඳහා හේතුවන ප්‍රධාන කරුණු 2ක් ලියන්න.

iii. ජෛව විවිධත්ව උණුසුම් කලාප ලෙස හඳුන්වන්නේ මොනවාද?

04. පරිසර පද්ධතියක් තුළ ජීවීන් අතර විවිධත්වයක් දැකගත හැක.

i. පරිසර පද්ධතියක් යනු කුමක්ද?

ii. විවිධත්වය හා සම්බන්ධ පහත පද පැහැදිලි කරන්න.

a). පරිසර පද්ධති විවිධත්වය

b). විශේෂ විවිධත්වය

c). ජාන විවිධත්වය

iii. ජෛව විවිධත්වයේ අවශ්‍යතාවය දැක්වීමට උදාහරණ දෙකක් ඉදිරිපත් කරන්න.

iv. ජෛව විවිධත්වයට තර්ජනය වන මානව ක්‍රියාකාරකම් තුනක් ලියන්න.

v. ජෛව විවිධත්වයට තර්ජනය වූ ස්වාභාවික ක්‍රියාකාරකම් 2ක් ලියන්න.